# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,922/3 — 1970 සැප්තැම්බර් 6 වැනි ඉරිදා — 1970.9.6**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## වෙනත් පත්කිරීම් ආදිය

**1970 අංක 281/2**

ගරු විදේශීය හා දේශීය වෙළඳ ඇමතිතුමා විසින් කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයේ කර්මාන්ත ව්‍යවස්ථා අධ්‍යක්ෂ ලංකා පරිපාලන සේවයේ II පංතියේ එල්. එන්. ද එල්. බණ්ඩාරනායක මහතා ස්වකීය රාජකාරිවලට අතිරේකව, 1970 ජූලි මස 10 වැනි දින සිට, ආනයන හා අපනයන නියෝජ්‍ය පාලකවරයකු වශයෙන් සතුටින් පත් කරනු ලැබ සිටී.

ජයන්ත කැලේගම,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 අගෝස්තු මස 30 වැනි දින.

9—529,

## ආණ්ඩුවේ නිවේදන

ඇල්. ඩී.—බී 96/50

### හඟුරන්කෙත ඇසල පෙරහැර

#### නිවේදනය

1951 අප්‍රේල් මස 6 වැනි දින අංක 10,232 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද හඟුරන්කෙත ඇසල පෙරහැරට අදාළ වන ආඥා පනත් පිළිබඳ වූ නියෝගවල 1 වැනි සහ 2 වැනි නියෝගවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක වන මම, මෙම නිවේදනයෙන්—

(1) 1970 සැප්තැම්බර මස 7 වැනි දිනයෙන් ආරම්භ ව 1970 සැප්තැම්බර මස 18 වැනි දිනයෙන් අවසන් වන කාලය, 1970 වර්ෂය තුළ ඉහත කී නියෝග බලපැවැත්විය යුතු කාලය වශයෙන් ඉහත කී නියෝගවල 1 වැනි නියෝගය යටතේ නියම කරමි. තවද,

(2) මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ප්‍රදේශය, 1970 වර්ෂය තුළ දී එකී නියෝග අදාළවීමේ කාර්යයන් සඳහා කඳවුරු ප්‍රදේශ විය යුතුයයි ඉහත කී නියෝගවල 2 වැනි නියෝගය යටතේ තීරණය කරමි.

ෆී. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති.

1970 සැප්තැම්බර් මස 4 දින, කොළඹ දී ය.

#### උපලේඛනය

**කඳවුරු ප්‍රදේශය**

උඩහේවාහැට ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ දියතිලක කෝරළයේ හඟුරන්කෙත ග්‍රාම සේවක කොට්ඨාශයට අයත් හඟුරන්කෙත පිහිටා ඇති පහත සඳහන් මායිම් ඇතුළත වූ සම්පූර්ණ භූමි ප්‍රදේශය :—

| | |
|---|---|
| උතුරට : | පිලපිටිය කඳුර සිට මහනුවර–රාගල රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ පාරට වැටෙන අඩිපාර, මහනුවර–රාගල රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ පාර සහ ආර්. ඊ. ඇස්. ද සොයිසා මහතාගේ ඉඩමේ උතුරු මායිම, |
| දකුණට : | පැටව්ල් ගබඩාවේ සිට ලංකා දුම්කොළ සමාගමේ භූමියට වැටෙන පාර, සහ ලංකා දුම්කොළ සමාගමේ භූමියේ සිට බොරහින්න පාරට වැටෙන රබර් වත්තත් ප්‍රසිද්ධපාර, |
| නැගෙනහිරට : | එළමල්වැව කඳුර, සහ |
| බස්නාහිරට : | පැල් ලිඳ පොල්වත්තේ නැගෙනහිර මායිම, කුඹුරේ ගෙදර වත්තේ නැගෙනහිර මායිම, නවන්එළිය කුඹුරේ නැගෙනහිර මායිම, පිලපිටිය කුඹුරේ නැගෙනහිර මායිම, වැව් ලියද්ද කුඹුරේ නැගෙනහිර මායිම සහ බොදන්ධාරාවේ කුඹුරේ නැගෙනහිර මායිම. |

9—530


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

668/5 — ජේ 16762—10,850 (70/9)